# තනතුරු - ඇබෑර්තු

## කුරුණෑගල ප්‍රාදේශීය සභාව

### සේවා ගිවිසුම මත කම්කරුවන් බඳවා ගැනීම

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා සේවා ගිවිසුම මත (මාස 06 ක කාලසීමාවක් සඳහා) සේවකයින් බඳවා ගැනීමට අදාළ සුදුසුකම් ලබා ඇති, කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**02. පුරප්පාඩු පවතින තනතුරු :**

| *අනු. අංකය* | *තනතුර* | *පුරප්පාඩු* | *වැටුප් ක්‍රමය* |
|---|---|---|---|
| 01 | විදුලි කාර්මික | 02 | දෛනික වැටුප් ගෙවීම් පදනම මත |
| 02 | රියදුරු | 03 | දෛනික වැටුප් ගෙවීම් පදනම මත |

- මතු දැක්වෙන ආකෘතියේ ප්‍රකාර පිළියෙල නොවූ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ඉල්ලුම්පත් තැපෑලේ දී නැතිවීම හෝ ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත් ගැන වගකීම තමන් විසින්ම භාරගත යුතුය.

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

I. මෙම තනතුර ස්ථිර පත්වීමක් සඳහා සුදුසුකමක් නොවේ.

II. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවලට ද රජයේ දෙපාර්තමේන්තුවල රෙගුලාසිවලට ද වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලු සේවකයින් බැඳී සිටිය යුතුය.

III. වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි 16 වන වගන්තිය ප්‍රකාරව දෛනික වැටුප තීරණය කරනු ඇත.

( රියදුරු තනතුරේ දිනක වැටුප - රු. 2019.33/=,
විදුලි කාර්මික තනතුරේ දිනක වැටුප - රු. 1986.66/= )

IV. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ( PSPF ) සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට ( ETF ) දායකවිය යුතුය.

**04. වයස් සීමාව**

i. තනතුරු සඳහා ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු හා වයස 45 ට නොවැඩි විය යුතුය.

**05. අධ්‍යාපන සුදුසුකම් / වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද :**

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම්* | *පළපුරුද්ද* |
|---|---|---|---|
| විදුලි කාර්මික | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකවත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර ) | රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ වෘත්තීය පුහුණු ආයතනයක හෝ තෘතීය ආයතනය විසින් පිළිගත් ආයතනයක විදුලි කාර්මික ශිල්පය පිළිබඳ පුහුණු සහතිකය. | පිළිගත් ආයතනයක වසර 02 ක පළපුරුද්දක් තිබීම (සහතිකයක් මගින් සනාථ කළ යුතුය ) |

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් | පළපුරුද්ද |
|---|---|---|---|
| රියදුරු | අ.පො.ස (සා/පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාරගණනකදී යටත් පිරිසෙන් විෂයන් 2 කට සම්මාන සහිතව විෂයන් 6 ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයන් 5 ක් සමත් විය යුතුය. | C,C1,D,D1,G,G1,J පංතිවලට අදාළ රියදුරු බලපත්‍ර තිබිය යුතුය. (බර වාහන රියදුරු බලපත්‍රය (තාර බර හොණ්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන හා බර ටේලර් සහ මහින් 32 ට වැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා මෝටර් රථ කොමසාරිස්වරයා විසින් නිකුත් කරණ ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. (A පන්තියේ රියදුරු බලපත්‍රයක් ) | රියදුරෙකු වශයෙන් වසර 03 ක පලපුරුද්දක් තිබිය යුතුය (සේවා සහතිකයක් මඟින් සනාථ කළ යුතුය ) |

**06. පොදු කොන්දේසි :**

I. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

II. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වසර 03 ක් කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. ඒ බව පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකයක් මඟින් සනාථ කළ යුතුය.

III. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමකින්, විශිෂ්ඨ චරිතයකින් හා ප්‍රමාණවත් ශරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු අතර, දණ්ඩනීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

IV. තනතුරට අදාළව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් මඟින් සුදුස්සන් තෝරා ගැනේ.

**07. අයදුම්පත් සමඟ ඉදිරිපත් කළ යුතු වෙනත් ලිපි ලේඛන :**

අයදුම්පත් සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය.

I. උප්පැන්න සහතිකය
II. අධ්‍යාපන සහතික / පාසැල් හැරයාමේ සහතිකය
III. වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතික
IV. ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත
V. රියදුරු තනතුර සඳහා ඉල්ලුම් කරන්නේ නම් වලංගු රියදුරු බලපත්‍රයේ ඡායා පිටපත
VI. පදිංචිය සනාථ කිරීම පිණිස තමන් ස්ථිර පදිංචි ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා විසින් නිකුත් කරන පදිංචි සහතිකය
VII. මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක් ( එක් සහතිකයක් තමන් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරයාගෙන් ලබාගත යුතුය )

ඔබ විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පතෙහි සඳහන් අධ්‍යාපන සුදුසුකම් අනුව, මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවකු බවට වන නිගමනය මත පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

**08. අයදුම් කළ යුතු ආකාරය :**

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස්කළ ඉල්ලුම්පත්, ඉල්ලුම් කරන තනතුර අනිවාර්යයෙන් ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ ලියා 2026.09.07 දින ප.ව 3.00 ට පෙර හෝ ඊට ප්‍රථම "ලේකම්, කුරුණෑගල ප්‍රාදේශීය සභාව, උඩදිගන, පුත්තලම් පාර, කුරුණෑගල" ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලය කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සතුවේ.

ආර්.එම්.ටී.කේ.රත්නායක,
ලේකම්,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව,

2026 අගෝස්තු මස 21 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.